# දැන්වීමයි

ඉන්දියානු රජයේ මූල්‍ය අනුග්‍රහයෙන් ඉදිකරනු ලබන නිවාස ව්‍යාපෘතියේ නිවාස වල ඉදිකිරීම සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් තාක්ෂණික සුදුසුකම් කැඳවීම.

ඉන්දියානු රජයේ මූල්‍ය අනුග්‍රහයෙන් වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ සහභාගීත්වයෙන්, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ තාක්ෂණික දායකත්වයෙන් නුවරඑළිය හා රත්නපුරය දිස්ත්‍රික්ක වල පහත ඇමුණුමේ (ඇමුණුම් අංක 01) පරිදි වතු නිවාස ඉදිකිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් තාක්ෂණික සුදුසුකම් කැඳවනු ලැබේ. මේ පිළිබඳ විස්තර මෙම දැන්වීමට අමතරව (https://www.nhda.gov.lk/)දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කර ඇත.

එක් නිවසක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල රු. 2,700,000.00 කි. යෝජිත නිවාස සැලැස්ම (ඇමුණුම් අංක 02) හා ප්‍රමාණ පත්‍රය (ඇමුණුම් අංක 03) මේ සමඟ ප්‍රසිද්ධ කර ඇත.මේ සඳහා ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන ඉල්ලුම්කරුවන් පහත අයදුම් පත්‍රය (ඇමුණුම් අංක 04) හි සඳහන් ආකාරයට තමා විසින්ම සාදාගන්නා ලද එක් අයදුම්පත්‍රයක් පමණක් පිළියෙල කොට ඒ සඳහා උපකාරී වන අමතර ලේඛණ/ඡායාරූප ආදිය සමඟ සහතික කර සැපයුම් ලබාදීමට බලාපොරොත්තු වන වතුවල ප්‍රමුඛතා ලේඛණයක් (ඇමුණුම් අංක 05) ද සහිතව පහත සඳහන් ස්ථාන වලට ලියාපදිංචි තැපෑලෙන් හෝ රාජකාරි වේලාවන් තුල 2026 ජූනි මස 09 වන දින ප.ව 4.00 ට පෙර මුද්‍රා තබන ලද අයදුම්පත් පහත සඳහන් ස්ථානවල තබා ඇති මුද්‍රා තැබූ පෙට්ටි වලට දැමීම සිදුකල හැක.

අයදුම් පත්‍ර භාරදිය හැකි ස්ථාන.

| අනු අංකය | ආයතනය | ලිපිනය |
|---|---|---|
| 01. | ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය | කවුන්සලර්, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය, 36–38, ගාලු පාර, කොළඹ 03. |
| 02. | සහකාර ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය | සහකාර ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය, අංක 42, හිල්පන්කඳුර මාවත, අම්පිටිය පාර, මහනුවර. |
| 03. | ඉන්දියානු කොන්සල් ජනරාල් කාර්යාලය | ඉන්දියානු කොන්සල් ජනරාල් කාර්යාලය, අංක 107 B, නව පාර, හම්බන්තොට |
| 04. | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | සහකාර සාමාන්‍යාධිකාරි (ව්‍යාපෘති)<br>ජාතික නිවාස සංවර්ධන අධිකාරිය<br>නිවාස සංවර්ධන කොට්ඨාශය<br>සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත<br>තැ.පෙ.1826,කොළඹ 02 |
| 05. | දිස්ත්‍රික් කාර්යාලය<br>ජාතික නිවාස සංවර්ධන අධිකාරිය<br>නුවරඑළිය, රත්නපුරය, | දිස්ත්‍රික් කළමනාකරු,<br>ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,<br>නුවරඑළිය, රත්නපුරය, |
| 06. | වතු කාර්යාල | (ඇමුණුම් අංක 01) |

අයදුම් පත්‍ර විවෘත කිරීම කොළඹ පිහිටි ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේදී සිදුකරනු ඇත.

සුදුසු සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී ඇගයීම් නිර්ණායක පත්‍රයේ (ඇමුණුම් අංක 06) සඳහන් පරිදි ලකුණු ලබාදීම සිදුකරනු ලබනුයේ තාක්ෂණික සුදුසුකම් ඇගයීමේ පෝරමයේ සඳහන් තොරතුරු සහ අදාල උපකාරී ලේඛන,ඡායාරූප ආදිය මත පදනම්වය.වැරදි තොරතුරු ඉදිරිපත් කිරීම සහ පෙර ඉන්දීය

නිවාස ව්‍යාපෘති ඉදිකිරීම් සඳහා සහභාගීවී අතරමඟ ව්‍යාපෘති අතහැර දැමූ කොන්ත්‍රාත්කරුවන් මෙම ව්‍යාපෘතිය සඳහා සුදුසුකම් නොලබනු ඇත.

අදාල ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය සැපයුම්කරුට ප්‍රධානය වන නිවාස ඒකක සංඛ්‍යාව අනුව තීරණය වේ.එක් සැපයුම්කරුවෙකුට හෝ සැපයුම්කරුවන් කිහිපදෙනෙකුට පැකේජ පදනම මත මුළු නිවාස ඒකක සංඛ්‍යාව ප්‍රධානය කිරීම තීරණය කරනු ලැබේ.සැපයුම්කරුවෙකු හෝ සැපයුම්කරුවන් තෝරා ගැනීමේ අවසන් තීරණය ඉන්දිය මහකොමසාරිස් කාර්යාලය සතුවේ.

මේ පිළිබඳ වැඩිදුර විස්තර පහත සඳහන් ඊමේල් (E-mail) ලිපිනයෙන් හෝ දුරකථන අංක මඟින් ලබාගත හැක.

ඉ-මේල් ලිපිනය – nhdahd50000@gmail.com

අමතන්න:

1. ආර්.එම්.පියතිස්ස – සහකාර සාමාන්‍යාධිකාරි (ව්‍යාපෘති) – ජාතික නිවාස සංවර්ධන අධිකාරිය – 011-2389504/071-3609000
2. එච්.එම්.කේ.අතුල බණ්ඩාර - දිස්ත්‍රික් කළමනාකරු – ජාතික නිවාස සංවර්ධන අධිකාරිය , නුවරඑළිය – 071-4086121
3. ඒ.ටී.එම්.යූ.එම්.බී.තෙන්නකෝන්– දිස්ත්‍රික් කළමනාකරු – ජාතික නිවාස සංවර්ධන අධිකාරිය , රත්නපුරය – 076-0838047

දිනය :...26/05/2026..............

.........................................
ආර්.එම්.පියතිස්ස
සහකාර සාමාන්‍යාධිකාරි (ව්‍යාපෘති)
ව්‍යාපෘති ප්‍රධානි
ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

.......................................
වතු අධිකාරි/කළමනාකරු
....................................... වත්ත,
.......................................

ආර්.එම්. පියතිස්ස
සහකාර සාමාන්‍යාධිකාරි (ව්‍යාපෘති)
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
කොළඹ 02.